# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2081/34 - 2018 ජූලි මස 25 වැනි බදාදා - 2018.07.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : BD/RM/LND.2/PMORP - III

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/9/2012/අයිආර්/351.

මොරාණ ජලාශ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

උපලේඛනය I

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යල්වෙල ගමේ පිහිටි බදුල්ල මැනුම් අධිකාරි විසින් පිළියෙළ කර ඇති හු.මු.පි. අංක 72, අතිරේක අංක 12, පත්‍ර අංක 165හි දැක්වෙන ඉඩම් කැබලි.

01. **කැබලි අංක 2147**
ඉඩමේ නම: නෙලුව; හිමිකම් කියන්නා: කේ. එච්. එම්. කීර්තිසේන බංඩාර; ප්‍රමාණය : හෙක්ටයාර් 0.5059

02. **කැබලි අංක 2148**
ඉඩමේ නම: නෙලුව; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.2204

03. **කැබලි අංක 2149**
ඉඩමේ නම: නෙලුව; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0225.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් 2018 අගෝස්තු 14 වැනි දින පෙ.ව. 10.00ට රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2018 ජූලි මස 28 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූත්, ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. ඒ. කේ. වනසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
රිදීමාලියද්ද.

2018 ජූලි මස 20 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 – 383